# මේ මගේ නවාතැනයි

## BACK TO MY PLACE..

අතුල කල්දෙමුල්ල






### කොටස් ලෙසින් ලියන සත්‍යයට ලංවූ මනඃකල්පිතයක්

පාළුයි කිව්වේ ඩයන් කාත් කවුරුත් නැති නිසා ඇරත් මේ කැලෑව මැද? ඉස්සරහා ගෙදර අය හිටිය කියල වැඩක් නෑනේ.
හරි හරි ඉෂා අපේ මේ සෙට් එක ඉන්නවානේ.,ගෙදරට එන්ටර් වෙච්චි ගමන් ඔයාගෙන් කම්ප්ලේන් ...
කේසර දෙදෙනාගේ කතාවට මැදිහත්වේ.

හා., හා සෙට් එක.. ඒකද අර දවසක් ද ඉල්ලන් කෑවා කියන්නෙ නයිට් ක්ලබ් එකේදි හරිම සෙට් එක.. මැදට පනින්න එපා හරිද?
ඔන්න ඉෂා ආයෙ එල්ලෙන්න පටන්ගත්ත අනේ මන්ද මුන්ට විනාඩියකට ඉන්න බැරි හැටි. ඕවා නවත්තගන්න ඉෂා තව ටිකකින් ඔච්චා නැතිවෙලා යනවා.
ඒක නෙමේ ඩයන් , පලාත හරිම පාළුයි පවුල් කීයක විතර පදිංචි වෙලා ඇත්ද?
මේ ඉෂා., සංඝණනයකට නෙමේනෙ අපි මෙහෙ ආවේ. ටික දවසක් ෆන් එකක් අරන් , බුෂ් වෝක් එකක් දාලා, කූල් වෙන්න. පාඩම් කරලා වැඩ කරලා ඈගේ තියෙන "ආතතිය" අඩුකරගන්න එක කොච්චර දෙයක් ද?

මේ මේ රිකී ඔයාලගේ බර වචන මට තේරෙන්නෙ නෑ.

අනේ පලයන් බං යන්න සිංහල සුද්දී..
බන් ආතතිය කියන්නේ ස්ට්‍රෙස් එකට. කොහෙද ඉතිං පොඩිකාලෙ මෙහෙ ආව කියල ඉරිදට සිංහල ඉස්කෝලෙටවත් ගියායැ.

මං දන්න සිංහල හොදටෝම ඇති ඊයෙ පෙරේද ආපු අයටත් දැන් සිංහල අමාරුනේ. මතක බෑ කියල කියන්නෙ. හරි අපි දැන් ඔතනින් මෙව්වා නවත්වමු කේසර...

ඉෂාගේ විධානය ගැන මදක් සිනා පෑ ඩයාන්..උඹලා ඉෂා බයිට් කරන්න හැම වෙල්ම බැලුවත් මෙතැනට ඉන්න තිබුනේ නිලුක්ෂි.,.,.
එහෙනම් පුතෝ නෝකතා.. නෝ සිනා ..
ඩයන් ගෙදර දොරගුළු හරිමින් සෙස්සන්ට ඇතුළු වන්නට අවස්ථාව ගෙනදෙයි.

ෂා... පට්ට... පට .. පට මචං එළියෙන් පේනව වගේ නෙමේනේ.
මාරම ගති,.. ආ අර අතන ජනේලෙන් කෙලින්ම පේන්නෙ පූල් එක.
ගේ තුලට වහා දිවයන සගයින් ඇතුලත පිරි සුන්දරත්වය නරඹති.පිළිවෙලකට සකස් කරන ලද ගේ දොර බඩු මුට්ටු හා ක්‍රිස්ටල් වර්ගයේ විදුලි බුබුලින් සුරසුනු ශාලාව ඇතුලතට දිවෙන මග පර්සියානු වර්ගයේ මිල අධික බුමුතුරුණු රාජකීයත්වය උසුලයි.

ඇත්තටම නයිස් ප්ලේස් ඩයාන් ., මං හිතන්නේ මේවා ජෙෆ්ට දෙමාපියන්ගෙන් හබ්බවෙච්චා. බලන්න ගොඩක් ඇන්ටික් බඩු.
වටපිටාවෙන් පේනවට වඩා ඇතුල රජමාලිගාවක්නෙ......
ඉෂා තමන්ගේ රුව අසල වූ දිගැටි පෞරාණික කැටයම් සපිරි කැඩපතෙන් බලනා අයුරු ඩයන් ගේ නෙත ගැටේ. ඈ වරක් දෙවරක් දෙවුර සලා එක් එක් අයුරෙන් නිරූපනයේ යෙදෙන අයුරු පෙනේ.
හැබෑවට මට ලැබුනාවූ සුන්දරියක යැයි ඩයාන් ට සිතෙයි. ඕනෑම තැනකදී කතාබහේදී ඉදිරියෙන් සිටින්නට පසුබට නොවන ඈතුළ අනුකම්පාව, දයාව කොතරම් පිරී ඇත්ද යන්න ඩයන් හොඳින්ම දනී. තම සගයින් පිහිනුම් තටාගයේ කෑ ගසමින් විනෝදවන අතරතුරේ ඉෂාත්, ඩයනුත් ගේ දොර ඇතුලාන්තයේ සිරිවිඳිමින් යනෙන අතරතුර ඩයන් නිවසේ එල්ලා තිබෙන වයෝවෘද්ධ යුවලකගේ පින්තූරයක් අසල නතර වේ. එදෙස බලා ඉන්නා ඩයන් ගේ දෑස දිප්තියෙන් දැල්වේ. මේ කුතුහලය කුමක්දැයි වටපිටාව නරඹමින් යන ඉෂාට දැනේ.

"ඇයි ඩයාන් ඔයා මේ පින්තූරය දැකලා ගල් ගැහිලා වගේ බලා උන්නේ අනෙක මං දැක්කා මේ ගේ ඇතුලට ඇතුල් වෙච්ච වෙලේ ඉඳලා මොනවා හරි නැතිවෙච්චි බඩුවක් හොයනවා වාගේ ඔයා කලබලෙන් කාමරවලට එබිකම් කරනවා ......

"නෑ... ඉෂා මොකුත් නෑ .... අළුත් තැනකට ආවහම ටිකක් සෙවිල්ලෙන් ඉන්න එපායැ. ඩයන් ඉෂාගේ කතාව වෙනතක රඳවන්නට උත්සහායක යෙදෙයි.

"නෑ මුකුත් නෑ නෙමෙයි ඔයා මොකක්දෝ බර කල්පනාවකට වැටුනා.
ඉෂා ..... මේ ඉන්නේ ජෙෆ්ගේ අම්මයි තාත්තයි වෙන්නැති මේ දෙන්නා දකිනකොට මට මේ වගේ" දෙන්නෙක් දැකලා පුරුදු ගතියක් ආවා. එත් කොහෙදෝ කියලා මට මතකෙට එන්නේ නෑ.

ඉෂා තමන්ගේ රුව අසල වූ දිගැටි පෞරාණික කැටයම් සපිරි කැඩපතෙන් බලනා අයුරු ඩයන් ගේ නෙත ගැටේ. ඈ වරක් දෙවරක් දෙවුර සලා එක් එක් අයුරෙන් නිරූපනයේ යෙදෙන අයුරු පෙනේ.
හැබෑවට මට ලැබුනාවූ සුන්දරියක යැයි ඩයාන් ට සිතෙයි.

අනේ ....අනේ ඔයා ඉතිං මේ ආපු ගමනේ දකින දකින දේ දැකලා තියෙනවා වාගේ කියලා කොච්චර නම් කීව්වද? එක නෙමේ මේ.....
මේ......පින්තූරේ ඉන්න කෙනා නම් ෂුවර් එකටම දැකලා ඇති හා....හා
ඈ සිනාසී ඒ අසල එල්ලා ඇති සුදු ලාබාල තරුණියකගේ පින්තූරයක් පෙන්වයි.
ඩයන්ගේ දෙනෙත් ඒ දෙසට ද වහා යොමුවේ. එය සඟවාගනිමින්
....හ්ම්...මේ වගේ face එකක් නම් කොහොමටවත් මගේ හිතට එන්නෑ
.........ඇයි ඒ.......
.........ඇයි ඒ කියන්නේ ඉෂා ඔයාගේ face එකනේ මගේ හිත ඇතුලේ තියෙන්නේ.... කරවටක් අත දමා ඇයගේ සිනිඳු කන්පෙත්ත හෙමීට මිරිකන ඩයන් ඇයව තම සමීපයට ලං කර ගනී.

අනේ යන්න..... මාව හම්බවෙන්න ඉස්සෙල්ලා අර යුනි එකේ සුදූ..
සුදු ඔව් කියන්න සුදු ....ඒ හම්බවෙච්චි සුදු ඔයා තමයි.
මං කිව්වේ සුදු කෙල්ල.....අර ඔසී කෙල්ල...

හරි හරි දැන් ඒවායින් වැඩක් නෑ...මතක් උන නිසා කිව්වෙ තරහ ගියානේද...නෑ ඉෂා තරහා ආවා..පොඩ්ඩක් හරි රිදවලා ඔයා හැපි නම්...ඔබෙ සැප මගෙ සතුටයි කියලා තමයි කියන්න වෙන්නේ.

ඉෂා ඩයන්ගේ අතින් ඇදගෙන තම මිතුරන් විනෝදවන පිහිනුම් තටාගය වෙත දිවයයි.
දැඩි අවුරස්නයත් සමග පිහිනුම් තටාගයේ ඒ මේ අත දිය දහර විසිරුවමින් පුංචි එවුන්සේ හැසිරෙන මිතුරන් දැක ඉෂාත් ඩයනුත් සමච්චලයට සිනාසේ....

"ඇයි...ඇයි මොකෝ මේ උඹලා දෙන්නට ජල භීතිකාවද අනික් උන්ට නිකං කින්ඩියට හිනාවෙන්නේ නැතුව අලුත් පෙම් යුවල හොදට නාගෙන ඉඳපල්ලා... කේසර ප්ලාස්ටික් බෝලයක් ගෙන තවකෙකු අතට යවමින් ඉෂාටත් ඩයන්ටත් වාග් ප්‍රහාරය එල්ල කරයි.

මචං අපේ මේ ගමනට නිලුක්ෂියි බුද්ධිකයි හිටියනම් හොඳයි නේද? උන් මුන් දෙන්නා වගේ නොවේ. පටාස් ගාලා ඕනෑම වැඩකට සෙට්. නැද්ද මං කියන්නෙ.... රොමේෂ් එසේ කියමින් ඉෂා නැවතත් අවුස්සන්නට සැරසෙයි.

බුද්ධික හා..හා ඔයාලගේ ඩිසේබල් වැඩවලට බුද්ධිකයත් මන්දබුද්ධික වෙයි..අනික ඔය කට්ටියටම එන්න තිබුනා කමියුනිටි බස් එකක් ගත්තා නම් නේද ...ඩයන්
විටින් විට වතුරේ ගිලෙමින් උඩට එන රිකී නොයිවසිල්ලෙන් අතේ යමක් රඳවාගෙන කෑ ගසයි.

මචාන් .... මේ බලපන් කේසර
මොකක්ද ..... මොකක්ද බං...

යුවතියකගේ යමක් හම්බඋනා.....

උඹ ඉතිං යුවතියකගේ යමක් කියලා අතේ ගුලිකරගෙන කිව්වාට අපි දන්නවායැ... මිතුරන් සියල්ලෝම රිකී වටා රොක්වේ.

...මේ ගෙදර කවුරුවත් නොහිටියාට මචෝ....කෙල්ලක් මේ ෆුල් එකේ නානවා... මේ Earing එකක් හා හා....Young style, young fashion මල්ලී... රිකී ඔහුගේ කණට Earing එක තබා පෙන්වයි.

හා..හා ලතා වගේ දැන්... බිකිනියකුත් හොයාගනිං ෂුවර් එකටම එහා ගෙදර වයසක සුද්දිගේ Earing එකක්...
මූටත් ඉතිං එල්ලෙන දේවල් තමා හම්බවෙන්නෙ...පරිස්සමෙන් අරං තියාගනින්.බලපන් තව මොනවද වැටිලා තියෙන්නෙ කියලා.
සියල්ලෝම මහ හඬින් සිනාසේ.

බොහෝ වේලාවක් පිහිනුම් තටාගයේ විනෝද වූ මිතුරන් විනෝදය මෙන්ම දැඩි වෙහෙසකට පත්ව ගොඩට ඇදේ.

"මචෝ ..... අද Friday දවස... අපිට නම් ඉතිං කවදත් Friday දවස Good Friday නැද්ද? බාබකිව් පාරක් දාලා හොඳ ආතල් එකක් ගන්න ඕනෑ.

නැතුව.. නැතුව Sing a Song පාරකුත් දාලාම ඉවරයක් කරන්න ඕනි. රොමේෂ්ගේ දැඩි උනන්දුව අනෙකුන් ද අනුමත කරයි.

අඳුර ගලා එන අහස් කුසත් විටින් විට රූස්ස ගස් අතරින් පියඹා යන කුරුලු රංචුත් සැඳෑයම පසක් කරයි. නෑම අවසන් කල සියල්ලෝ එකිනෙකා නිවසේ Backyard එක කරා ඇදෙන්නේ බාබකිවු එකට අවශ්‍ය කලමනා සම්පාදනය කිරීමටයි. ඩයන්ටත් ඉෂාටත් පැවරුනු රාජකාරිය වුයේ මස්පෙති මැරිනේටඩ් කිරිමේ කාර්‍යභාරයයි.

අඳුර ගලන අතරතුරේ Backyard එකේ Dock එකේ තැනින් තැන දැල්වෙන ඉටිපන්දම් එළිය අවට අඳුර දීප්තිමත් කරන්නේ අඩ අඳුරක සොඳුරු මොහොතක් සකස්කරමිනි. බාබකිවු මැෂිමෙන් නැගෙන දුමාරයේ ගලාඑන පුළුටු මස් බැදෙන සුවඳ සුලඟට මුසුවෙමින් අඳුරට එකතුවෙන්නේ යම්කිසි ගුප්ත බවකී..එහෙත් මස්පෙති එකිනෙක ඒ මේ අත පෙරලමින් මුවග රැඳුන බියර් බෝතලයක රස පහස විදින මිතුරනට තව තවත් රාත්‍රිය නැගෙන යාමය හුදෙක් විනෝදමය කාල පරිච්චේදයකටයි මුල පුරන්නේ.

මස්පෙති පිලියෙළ කරදීමෙන් පසු අසල වු දිග බංකුවකට පිට දි නිදහස් සුවය විඳිනා ඉෂාටත් ඩයන්ටත් ඇසෙන්නේ සගයන්ගේ තොරතෝංචියක් නැති කතාබහ සමග එකතුවන රැහැයියනගේ නාදය පමණකි. එකිනෙකා දැල්වී නිවීයන කණාමැදිරි එළි අතරින් යායට පෙලගැසී ඇති රූස්ස ගස් මුළු පලාතම පාලු බවකින් වෙලාගනියි. බීර බෝතලයක රහ විදින රොමේෂ්ට අමුත්තක් දැනේ. මීටර් කීපයකට එහායින් වත්ත මායිමේ සරසර හඬ නැගෙන අයුරුයි. ගිනි මහද්දහනේ ගිණියම් වී වියලුනු කොළ යමෙකුගේ පයට පෑගී පොඩිවෙන අයුරුත් යමෙකු ගමන් ගන්නා ආකාරයක් හොදින් වැටහේ.

මචෝ.. වත්ත කෙළවර කව්දෝ ඇවිදින සද්දයක් එනවා කේසර...

ඔව් ....මටත් දැනෙනවා....ආ... අන්න කව්දෝ කබායක් දාගත්ත මනුස්සයෙක් පහලට යනවා නේද?

එකනේ රොමේෂ් මේ යක්ෂයා මොකෙක්ද මේ වෙලාවෙ මෙහෙ කරන්නේ.. බල්ලෙකුත් පස්සෙන් යනවා නේද? එකිනෙකාගේ දෑස් විමතියෙන් ඇලලේ.